
# <u>පුවත්පත් නිවේදනය</u>

## <u>2014 වසර තුළ රක්ෂණ කර්මාන්තයේ කාර්යසාධනය</u>

**දළ ලිඛිත වාරිකය**


රක්ෂණ සමාගම්වල වත්කම් සමඟින්, දීර්ඝ කාලීන මෙන්ම සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර යන අංශ දෙකෙහිම දළ ලිඛිත වාරිකයෙහි (GWP) වර්ධනයක් පෙන්නුම් කළ 2014 වසර, ශ්‍රී ලංකා රක්ෂණ කර්මාන්තය සඳහා තවත් ධනාත්මක වසරක් විය. රක්ෂණ සමාගම් වලින් උත්පාදනය කරනු ලැබූ දළ ලිඛිත වාරිකය (GWP) 5.14%ක් වූ අතර, වසරෙහි සමස්ත වත්කම් 13.81%කින් ඉහළ ගොස් තිබුණි.

2014 වසරේ දී රුපියල් මිලියන 99,872ක් වන දීර්ඝ කාලීන රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ සඳහා මුළු දළ ලිඛිත වාරිකය, 2013 වසරේ දී එම අගය වූ රුපියල් මිලියන 94,987ට සාපේක්ෂව, 5.14%ක වර්ධනයක් පෙන්නුම් කරයි. 2014 වසර තුළ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය රුපියල් මිලියන 55,262ක වාරික ආදායමක් වාර්තා කළ අතර, (2013: රු.මිලියන 53,311) දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර වාර්තා කළ වාරික ආදායම රුපියල් මිලියන 44,610 (2013: රු. මිලියන 41,676) කි. මෙසේ, 2013 වසර හා සසඳන කළ 2014 වර්ෂයේදී පිළිවෙලින් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයේ සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ දළ ලිඛිත වාරික ආදායමෙහි 7.04%ක සහ 3.66%ක වර්ධනයක් පිළිබිඹු විය.




**මුළු වත්කම්**

2013 වසර අවසානයේ දී වාර්තා වූ අගය වූ රුපියල් මිලියන 357,465 හා සසඳන කල 2014 දෙසැම්බර් 31 දිනට වාර්තා වූ රක්ෂණ සමාගම් විසින් දරන ලද මුළු වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 406,827 ක් වුයේ 13.81%ක වර්ධනයක් පෙන්නුම් කරමිනි. වසරින් වසර පිළිවෙලින් 10.39%ක සහ 15.52%ක වර්ධන වේගයක් සනිටුහන් කරමින් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවල වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 163,834ක් (2013: රුපියල් මිලියන 148,410) වූ අතර, දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර වල වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 249,850 ක් (2013 : රුපියල් මිලියන 216,275) විය.




**රජයේ සුරැකුම්පත්වල ආයෝජනය**

**2014** අවසානය වන විට, රජයේ ණය සුරැකුම්පත්වල ආයෝජනය කර තිබූ මුළු දීර්ඝ කාලීන රක්ෂණ සමාගම්වල වත්කම් ප්‍රමාණය වූ රුපියල් මිලියන **111,600, 44.67%**ක ප්‍රමාණයක් **(2013 :** රුපියල් මිලියන **93,539; 43.25%)** නියෝජනය කළ අතර, එසේ ආයෝජනය කර තිබූ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයන්හි මුළු වත්කම් ප්‍රමාණය වූ රුපියල් මිලියන **25,496,** ප්‍රතිශතයක් ලෙස **15.56% (2013:** රුපියල් මිලියන **28,163; 18.98%)** ක් නියෝජනය කර තිබේ. ඒ අනුව, **2014** දෙසැම්බර් **31** දිනට, රජයේ ණය සුරැකුම්පත්වල ආයෝජනය කර තිබූ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර සහ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරවල මුළු වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන **137,096** ක් **(2013 :** රුපියල් මිලියන **121,702)** විය.

**ආරවුල් නිරාකරණය සහ විමර්ශනය**

ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය, රක්ෂණ ඔප්පු හිමියන්ගේ අයිතීන් ආරක්ෂා කිරීමේ අරමුණින් ජීවිත හා සාමාන්‍ය රක්ෂණ ඔප්පු යටතේ වන රක්ෂණ හිමිකම් ඉල්ලීම් සහ රක්ෂණ නියෝජිතයින්ගේ සුදුසුකම්වලට අදාළ රක්ෂණ ඔප්පු හිමියන්ගේ දුක්ගැනවිලි සම්බන්ධයෙන් විමර්ශනයක් සිදු කරනු බලයි. **2000** අංක **43** දරන රක්ෂණ කර්මාන්තය විධිමත් කිරීමේ පනතෙහි **98** වගන්තිය ප්‍රකාරව, රක්ෂණ හිමිකම් ඉල්ලුම් කරන්නන් විසින් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයට යොමු කරනු ලබන, හිමිකම් නිරාකරණය කිරීමට අදාළව රක්ෂණකරුවන් සහ හිමිකම් ඉල්ලුම් කරන්නන් අතර ආරවුල් විමර්ශනය කිරීමට සහ නිරාකරණය කිරීමට ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයට බලතල ඇත. **2014** වසර තුළ එවැනි කාරණා **284**ක් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය වෙතට යොමු කර තිබුණි. **2013** සහ **2014** වසරවල ලැබුණු එවැනි පැමිණිලි **230**ක් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය විසින් නිරාකරණය/විමර්ශන අවසන් කර තිබුණි. නිරාකරණය කරනු ලැබූ පැමිණිලි අතුරින්, පැමිණිලි **38**ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ මැදිහත්වීම මත රක්ෂණකරුවන් විසින් අදාල හිමිකම් ගෙවීමට කටයුතු යොදන ලදී.

**රක්ෂණකරුවන්**

**2014** දෙසැම්බර් **31** දිනට ක්‍රියාත්මක රක්ෂණ සමාගම් (රක්ෂණකරුවන්) **21** අතුරින්, **12**ක් සංයුක්ත සමාගම් ද (සාමාන්‍ය සහ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර දෙකෙහිම යෙදී සිටින), **06**ක් සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සිදුකරන සමාගම් ද, **03**ක් දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර පමණක් සිදුකරන සමාගම් ද වේ.

**රක්ෂණ තැරැව්කරුවන්**

**2014** වසර තුළ, රක්ෂණ තැරැව්කාර සමාගම් **59**ක් වෙළඳපල තුළ ක්‍රියාත්මක විය. රක්ෂණ තැරැව්කාර සමාගම්, රක්ෂණ තැරැව්කාර ව්‍යාපාරවල නිරතවීම පිණිස පනතෙහි **82**වන වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා රක්ෂණ සමාගම සමඟින් ලියාපදිංචිව සිටී. පසුගිය වර්ෂවල පරිද්දෙන්ම, **2014** වසරේ දී ද දීර්ඝ කාලීන ව්‍යාපාරය සඳහා වූ රක්ෂණ තැරැව්කරුවන්ගේ දායකත්වය නොවැදගත් වූවක් විය. කෙසේවෙතත්, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය හරහා උත්පාදනය වූ වාරික ආදායම මගින්, සාමාන්‍ය රක්ෂණ වෙළඳපලෙහි අතරමැදියෙකු ලෙස තැරැව්කරුවන්ගේ ඇති වැදගත්කම පෙන්නුම් කරයි.

දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාරයට අදාළව රක්ෂණ තැරැව්කාර සමාගම් හරහා උත්පාදනය වූ වාරික ආදායම රුපියල් මිලියන **158**ක් (**2013:** රුපියල් මිලියන **191**) වූ අතර, සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයට අදාළව උත්පාදනය වූ වාරික ආදායම රුපියල් මිලියන **14,559** (**2013:** රුපියල් මිලියන **14,189**) ක් විය. රක්ෂණ තැරැව්කාර සමාගම් හරහා සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාර සහ දීර්ඝ කාලීන රක්ෂණ ව්‍යාපාර යන දෙකින්ම උත්පාදනය වූ මුළු වාරික ආදායම, පූර්ව වර්ෂයේ එකී ආදායම වූ රුපියල් මිලියන **14,380**ට සාපේක්ෂව, **2014** වසරේ දී රුපියල් මිලියන **14,716** කි. ඒ අනුව, **2013** වසරට සාපේක්ෂව, **2014** වසරේ දී, රක්ෂණ තැරැව්කාර ව්‍යාපාර හරහා උත්පාදනය වූ මුළු වාරික ආදායම **2.34%**ක වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

*සටහන:*

1) *2014 සංඛ්‍යා - යාවකාලීන*
2) *2013 සංඛ්‍යා - පුනර්යුක්ත විගණිත*
3) *අවශ්‍ය කරනු ලබන තොරතුරු ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොමැති බැවින්, ඉහත විශ්ලේෂණය සඳහා ජාතික රක්ෂණ භාරකාර අරමුදලෙහි තොරතුරු අන්තර්ගත කර නැත.*
4) *ජාතික රක්ෂණ භාරකාර අරමුදලෙහි වර්ජන, කැරලි, සිවිල් කෝලහාල සහ ත්‍රස්තවාදී රක්ෂණ වාරික ආදායම, රක්ෂණ සමාගම්වල පොදු රක්ෂණ ව්‍යාපාර දළ ලිඛිත වාරිකය සඳහා සැලකිල්ලට නොගැනුණි.*
5) *බැහැර කරන ලද අන්තර් ඛණ්ඩ ශේෂයන් (එනම් දීර්ඝ කාලීන රක්ෂණ සහ සාමාන්‍ය රක්ෂණ ඛණ්ඩයන් අතර ගනුදෙනු) 2014 වසර සඳහා රුපියල් මිලියන 6,857ක් ද, 2013 වසර සඳහා රුපියල් මිලියන7,220 ක් ද විය.*

**ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය**

11 වන මහල, නැගෙනහිර කුළුන

ලෝක වෙළඳ මධ්‍යස්ථානය

කොළඹ 01.

| | |
|---|---|
| වෙබ් අඩවිය : **www.ibsl.gov.lk** | විද්‍යුත් ලිපිනය : **info@ibsl.gov.lk** |
| දුරකතන : **011 2396184- 9** | ෆැක්ස් : **011 2396190** |

09/09/2015